# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,474 - 2026 ජනවාරි මස 30 සිකුරාදා - 2026.01.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... | 152 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් | |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 පෙබරවාරි මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 පෙබරවාරි මස 06 වැනි දින දහවල් 12. 00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩය-3 සේවා ගණය (MT -1-2025 ) (තාක්ෂණික සහයක -කෘෂි ව්‍යාප්ති ) III ශ්‍රේණිය සඳහා විවෘත බඳවා ගැනීම - 2025

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩය - 3 සේවා ගණය (MT-1-2025 ) (තාක්ෂණ සහයක - කෘෂි ව්‍යාප්ති) III ශ්‍රේණියේ තනතුරට අදාළ පුරප්පාඩු පිරවීම සඳහා මධ්‍යම පළාත තුළ පදිංචි සුදුසුකම්ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. වැටුප් පරිමාණය :

2025.03.25 දිනැති අංක 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MT 01-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර ,එයට අදාළ වැටුප් පරිමාණය :

රු. 50,090 – 10X540 – 11X630 – 10X1010 – 10X1190 – රු. 84,420/- ක්,

වන අතර, පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

03. සේවා කොන්දේසි :

3.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය.

3.2 මෙම තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයින් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව මෙම සේවයට පත් කරනු ලැබේ.

3.3 තනතුරට බඳවා ගැනීමෙන් පසු මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩය - 3 සේවා ගණය (MT 1-2016) (තාක්ෂණ සහයක -කෘෂි ව්‍යාප්ති) සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ දැක්වෙන ආකාරයට අදාළ කාර්යක්ෂමතා කඩඉම් හා රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගවලින් සමත්විය යුතුය.

3.4 මෙම තනතුරට පත් කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාත තුළ වසර 05ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන් සේවය කළ යුතු අතර, එම කාලය තුළදී මධ්‍යම පළාතෙන් පිටතට ස්ථාන මාරු ලබා ගැනීමට කරනු ලබන කිසිදු ඉල්ලීමක් සලකා බලනු නොලැබේ. තවද, පත් කරනු ලබන සේවා ස්ථානයේ වැඩ භාරගත් දින සිට අවුරුදු 03ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතුය.

3.5 මෙම තනතුරට බඳවා ගැනීමෙන් පසු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට, මධ්‍යම පළාත් මූල්‍ය රීති සංග්‍රහයට, මධ්‍යම පළාත් තාක්ෂණික සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රයට, කාර්ය පරිපාටික රීති සංග්‍රහයටද, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට නොහොත් නියෝගවලටද, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලටද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලටද අනුව කටයුතු කළ යුතුය.

04. පුරප්පාඩු පවත්නා ක්ෂේත්‍රයන් :

මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩය - 3 සේවා ගණය (MT 1-2025) (තාක්ෂණ සහයක -කෘෂි ව්‍යාප්ති) III ශ්‍රේණියේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලබන අතර, මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

4.2 අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2026.02.13 දින වේ. අයදුම් කරන තනතුරට අදාළ සියලු සුදුසුකම් 2026.02.13 දින හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.

05. සුදුසුකම් :

5.1 අධ්‍යාපන සුදුසුකම් :

භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය සහ විද්‍යාව ඇතුළුව, දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

5.2 වෘත්තීය සුදුසුකම් :

I. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2012 ප්‍රකාරව අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් වල 05 වන මට්ටමේ පාඨමාලා සහතිකය (NVQ) ලබා තිබීම ;

*හෝ*

II. තෘතීය හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ඒ හා සමාන යැයි පිළිගනු ලබන සුදුසුකමක් ලබා තිබීම

5.3 පළපුරුද්ද - අදාළ නොවේ.

5.4 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් යෝග්‍ය වන යහපත් කායික, මානසික සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

5.5 වෙනත් සුදුසුකම් :

i. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
iii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට (2026.02.13) පූර්වාසන්නයෙන් වූ වසර 03ක කාලය තුළ මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. (අයදුම්කරු මෙම පළාතේ වසර 03කට වඩා ස්ථිර පදිංචි අයෙකු සමඟ විවාහ වූ විට කලත්‍රයාගේ ස්ථිර පදිංචිය සලකා බැලේ.)
iv. යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම තනතුරුවලට ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම් නොලබයි.
v. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව 2026.02.13 දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

06. වයස් සීමාව :

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන **2026.02.13** දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

07. විභාගය පිළිබඳ විස්තර

i. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අයදුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.
ii. අපේක්ෂකයා විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.
iii. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතුය.
iv. විභාග මධ්‍යස්ථානය - මහනුවරදී පමණක් පවත්වනු ලැබේ.

08. *බඳවා ගැනීමේ ක්‍රමය* :- ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත තරග විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.ලකුණු ප්‍රමුඛතාව අනුව පුරප්පාඩු සම්පූර්ණ කිරීමේදී කිසියම් අවස්ථාවක ඉතිරිව ඇති පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබා ගත් සුදුසුකම් ලත් අපේක්ෂකයන් සිටී නම් හා එම පුරප්පාඩු ද පිරවීමේ සේවා අවශ්‍යතාවයක් තත්කාලයේ පවතී නම්, එසේ සම ලකුණු ලබා ගත් අපේක්ෂකයන් අතුරින් වැඩිදුර තෝරා ගැනීමක් සිදු කිරීමට මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය. එහිදී රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2024 හි 02 ඡේදයේ සඳහන් 1 කොටස පරිදි අදාළ තෝරා ගැනීම් සිදු කරනු ලබයි.

09. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | පැය 01 | 100 | 40% |

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලත්වය, සිතීමේ, විශ්ලේෂණ තත්වයන්, තීරණය කිරීමේ ශක්තිය, විනිශ්චය කිරීම සඳහා වූ වාස්තවික ව්‍යුහගත ප්‍රශ්න වලින් යුක්තය. |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | **1. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂි කර්මාන්තයේ දායකත්වය**<br>1.1 දළ ජාතික නිෂ්පාදනයට කෘෂිකර්මාන්තයේ දායකත්වය,<br>1.2 රැකියා වියුක්තිය,<br>1.3 කෘෂිකර්මාන්තයේ අපනයන හා ආනයන තත්ත්වය .<br><br>**2. ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම**<br><br>**3. පස හා ශාක පෝෂණය**<br>3.1 පසේ ව්‍යුහය, වයනය, භෞතික හා රසායනික ලවණතාවය හා බෝග වගාව කෙරෙහි බලපෑම<br>3.2 ශාක පෝෂණය පාංශු / ශාක පෝෂණය කළමණාකරණය<br>3.3 පැලෑටි පෝෂණය පිළිබඳ විශේෂ කරුණු<br><br>**4. වී නිෂ්පාදනය**<br>4.1 පාංශු දේශගුණික අවශ්‍යතාවය<br>4.2 ප්‍රභේද<br>4.3 බිම් සකස් කිරීම හා තවාන් පාලනය<br>4.4 පළිබෝධ හා රෝග මර්දනය<br>4.5 පොහොර යෙදීම<br>4.6 ජල කළමණාකරණය/අස්වනු වැඩිකර ගැනීමේ නූතන ක්‍රමවේදය<br>4.7 අස්වනු නෙළීම හා පසු අස්වනු තාක්ෂණය<br><br>**5. වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය**<br>5.1 ලොකුළූනු, මිරිස්, අර්තාපල්, බඩඉරිඟු, සහ වෙනත් බෝගවල ප්‍රභේද<br><br>**6. එළවළු නිෂ්පාදනය**<br>6.1 එළවළු තවාන් පාලනය<br>6.1.1 කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය යොමු කර ඇති එළවළු වර්ග ප්‍රචාරණය හා රෝපණ කටයුතු, අස්වනු නෙළීම හා සැකසීම |

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 2. විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | **7. පළතුරු**<br><br>7.1 කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂ අවධානය යොමු කර ඇති පළතුරු වර්ග ප්‍රචාරණය හා රෝපණ කටයුතු,<br>7.2 අස්වනු නෙලීම හා සැකසීම<br><br>**8. බෝග ආරක්ෂණය**<br><br>8.1 බෝග වගාවට වැළදෙන ප්‍රධාන රෝග හා පළිබෝධ හඳුනා ගැනීම, ඒවායේ පාලන විධි<br>8.2 වල් මර්ධනය, වල් මර්ධන ක්‍රම<br>8.3 පළිබෝධ නාශක පාලනයේ දී පිළිපැදිය යුතු ආරක්ෂිත ක්‍රම<br><br>**9. ජලවහනය හා එහි වැදගත්කම**<br><br>**10. පාංශු රසායන**<br><br>10.1 පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම<br><br>**11. වාරිමාර්ග හා ජල කළමනාකරණ**<br><br>11.1 විවිධ භෝග වර්ග සඳහා උචිත ජල සම්පාදන ක්‍රම හා ඒවායේ ජල කළමනාකරණය<br>11.2 ක්ෂුද්‍ර ජල සම්පාදන ක්‍රම<br><br>**12. ගොවිපල් යාන්ත්‍රීකරණය**<br><br>12.1 ගොවිපල් යාන්ත්‍රීකරණයේ වාසි අවාසි<br>12.2 බිම් සකස් කිරීමට භාවිත කරන කෘෂි යන්ත්‍රෝපකරණ<br>12.3 ජල සම්පාදනය හා පැළෑටි ආරක්ෂණය සඳහා භාවිත කරන කෘෂි යන්ත්‍රෝපකරණ<br>12.4 ඉහත යන්ත්‍ර ක්‍රියාකරවීම හා නඩත්තුව<br><br>**13. මී මැසි පාලනය**<br><br>13.1 ආර්ථික වැදගත්කම<br>13.2 මී මැසි පාලනය ගෘහ ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම<br>13.3 අස්වනු ලබා ගැනීම හා වෙළඳපොළට සකස් කිරීම<br><br>**14. මල් වගාව හා භූමි අලංකරණය**<br><br>14.1 ආර්ථික වැදගත්කම<br>14.2 භූමි අලංකරණ ක්‍රම<br>14.3 වෙළඳපොළ සඳහා කැපූ මල් නිෂ්පාදනය හා ඒවා වෙළඳපොළට සකස් කිරීම<br><br>**15. ආරක්ෂිත බෝග වගාව**<br><br>15.1 වැදගත්කම<br>15.2 සැලසුම් කිරීම<br>15.3 බෝග තෝරා ගැනීම<br>15.4 පවත්වාගෙන යාම හා අස්වනු සකස් කිරීම |

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|
| 2. විෂයානුබද්ධ තාක්ෂණික ප්‍රශ්න පත්‍රය | **16. සත්ත්ව පාලනය**<br><br>16.1 කුකුළු පාලනය හා කිරි ගව නිෂ්පාදනය<br>16.2 සමෝදාන ගොවිපල් පාලනය යටතේ ඉහත සඳහන් සත්ත්ව නිෂ්පාදන පවත්වා ගැනීම<br><br>**17. කෘෂිකාර්මික ව්‍යාප්තිය**<br><br>17.1 කෘෂිකාර්මික ව්‍යාප්ති උපාය මාර්ග හා ක්‍රමවේදය<br>17.2 කෘෂිකාර්මික ව්‍යාප්ති සන්නිවේදන ක්‍රම<br><br>**18. පටක රෝපණය**<br><br>18.1 පටක රෝපණයේ මූලික සිද්ධාන්ත හා අතීත තොරතුරු පිළිබඳ දැනුම<br>18.2 පටක රෝපණයේ භාවිතයන් / යෙදීම්, උදාහරණ<br>18.3 පටක රෝපණයේ වාසි අවාසි<br><br>**19. පැළෑටි නිරෝධායනය පිළිබඳ දැනුම**<br><br>19.1 පැළෑටි නිරෝධායන රෙගුලාසි පිළිබඳ දැනුම<br>19.2 පැළෑටි නිරෝධායන ක්‍රම<br><br>**20. ශාක සංරක්ෂණය**<br><br>20.1 ශාඛ සංරක්ෂණයේ වැදගත්කම (ශාඛ /ජාන ප්ලාස්ම)<br>20.2 ශාඛ සංරක්ෂණ ක්‍රම ( ශාඛ /ජාන ප්ලාස්ම)<br><br>**21. ජෛව තාක්ෂණය**<br><br>21.1 DNA හි වැදගත්කම<br>21.2 ජානය යනු කවරක් ද, එහි ක්‍රියාකාරීත්වය<br>21.3 ජාන ඉංජිනේරු ශිල්ප ක්‍රම මගින් ශාඛ වැඩිදියුණු කිරීමට ඇති හැකියාව<br><br>**22. කෘෂිකර්ම සංවර්ධනය**<br><br>වර්තමාන කෘෂිකර්ම සංවර්ධන ප්‍රතිපත්ති, ඒවායේ ඇති වැදගත්කම, කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන්, කෘෂිකර්ම සංවර්ධනය හා සම්බන්ධ රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා වෙනත් ආයතන, මධ්‍යම රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ආයතන, ඒකක හා ඒවායේ කාර්යභාරය, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්තමාන ගැටලු හා අභියෝග, කෘෂිකාර්මික සංවර්ධනය රටේ සංවර්ධනයට ආධාරවන ආකාරය, කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන්වල යහපත් හා අයහපත් බලපෑම්. |

10. **අයදුම්කළ යුතු ක්‍රමය :**

I. අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිත කරමින් A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කර අපේක්ෂකයා තම අත් අකුරින් ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 03 තෙක් පළමු පිටුවට ද, අංක 04 සිට 06 තෙක් දෙවන පිටුවට ද, අංක 07 සිට 11 තෙක් තෙවන පිටුවට ද, ඉතිරිය සිවුවන පිටුවට ද, වන සේ සකස් කළ යුතුය. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අයදුම්පත්‍ර, අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර සහ නිවේදනයේ සඳහන් පරිදි මූලික සුදුසුකම් නොමැති බව අයදුම්පත්‍රයේ තොරතුරු අනුව පෙනී යන්නේ නම් ද කිසිදු දැනුම්දීමකින් තොරව එම අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ඔබ ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.

II. අයදුම්පත්‍රය පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

III. සෑම අපේක්ෂකයෙකුම රු 600.00 ක විභාග ගාස්තුවක් මධ්‍යම පළාත් සභාවට ගෙවිය යුතුය. මෙම විභාග ගාස්තුව මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්වරයාගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැරවන පරිදි අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම මධ්‍යම පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා, ඒ සඳහා ලබාගත් නිල් පැහැති ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. වෙනත් ශීර්ෂයකට ගෙවීම් කරන ලද කුවිතාන්සි හෝ මධ්‍යම රජයට අයත් කහ පැහැති කුවිතාන්සි අලවා ඇතොත් එම අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. එකී ලදුපත නොමැතිව යොමුකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, විභාගය සඳහා ගෙවන ලද විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත හෝ නැවත ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු නොකෙරේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ. ඔබ විසින් අයදුම්පතෙහි සඳහන් කොට ඇති භාෂා මාධ්‍ය කිසිදු අවස්ථාවක වෙනස් නොකෙරේ.

IV. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්වයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 ශ්‍රේණිගත කිරීමට අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රජයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය. දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් අයදුම්කළ යුතුය.

V. අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව නිවැරදිව සම්පූර්ණ කොට **2026.02.13** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **'ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර'** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩය - 3 සේවා ගණය (MT-1-2025 ) (තාක්ෂණ සහායක-කෘෂි ව්‍යාප්ති) III ශ්‍රේණියට බඳවා ගැනීම** "යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේ දී අස්ථානගත වන අයදුම්පත් සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාව වගකියනු නොලැබේ. අයදුම්කරන අවස්ථාව වනවිට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළවන අතර, අයදුම්පත් එවීමෙන් පසු ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

VI. අයදුම්පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලිපියක් හෝ තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි පිළිබඳ සලකා බලනු නොලැබේ.

VII. අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ.

VIII. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විසින් මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනයට අනුව අදාළ සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

IX. විභාග මධ්‍යස්ථානය පිළිබඳව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍රය මඟින් දැනුම් දෙනු ලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින්

නිවේදනයක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියවන www.psc.cp.gov.lk මඟින් පළකරනු ඇත. ප්‍රවේශපත්‍ර විභාගය පැවැත්වීමට දින 14කට පෙර අයදුම්කරුවන්ගේ අයදුම්පතෙහි සඳහන් ජංගම දුරකථන අංකය වෙත කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට විද්‍යුත් තැපැල මඟින් යොමු කරනු ලැබේ.

X. නිවේදනය පළ වී දින 04ක් 05ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම්, දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ විභාග අංශය වෙතින් විමසිය යුතුය.
( දුරකථන අංකය 081 – 2213097 )

11. විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත.

12. විභාගයට පෙනී සිටින සියලුම විභාග අපේක්ෂකයන් තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී පමණක් විභාගයට පෙනී සිටිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

13. **අපේක්ෂකයාගේ අනන්‍යතාවය :**

මෙම විභාගයට අයත් සෑම විෂයය පරීක්ෂණයක දී ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් තම අනන්‍යතාව ඔප්පු කර සිටීමට අයදුම්කරුවන් ක්‍රියා කළ යුතුය. මේ සඳහා පහත දැක්වෙන කවර හෝ එක ලියවිල්ලක් ප්‍රමාණවත් වේ.

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත.
- වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.
- වලංගු විදේශ ගමන් බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව කහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපාංග නොපැලඳ දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළුවිය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කරගනු නොලැබේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

14. **සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම :**

14.1. අයදුම්පත පිරවීමේ දී ඉතා සැලකිලිමත් විය යුතු අතර මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයෙකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම්, විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවක දී වුව ද ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

14.2. අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලෙක දී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු /ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව අනාවරණය වුවහොත් හෝ ඔහු /ඇය වෙත තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතුකොටගෙන දී තිබූ පත්වීම අහෝසි කිරීමට හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයෙන් පහකිරීමට වුව ද යටත් වේ.

15. අයදුම්කරුවන්ගේ විභාග ප්‍රතිඵල මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියවන www.psc.cp.gov.lk මඟින් පළකරනු ඇත.

16. මෙම නිවේදනයේ ආවරණය වන/නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද මෙම විභාගය පැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එසේම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන පැහැදිලි කිරීම/ තීරණය කිරීම මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

17. මෙම බඳවා ගැනීම සම්බන්ධ විස්තර මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.psc.cp.gov.lk හි පළකර ඇති අතර, අදාළ අයදුම්පත්‍රය එහිදී බාගත කරගත හැකිය.

18. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වෙනු ඇත.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

සුජානි ආර්.විජේතුංග,
ලේකම් (රා.ආ) ,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.

2026 ජනවාරි මස 26 දින
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර**

*තාක්ෂණික ඛණ්ඩය-3 සේවා ගණය (MT 1-2025) තාක්ෂණ සහයක-කෘෂි ව්‍යාප්ති III ශ්‍රේණිය සඳහා වන විවෘත බඳවා ගැනීම - 2025*

විභාග අංකය :- [ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- [ ] (සිංහල - S , දෙමළ - T, ඉංග්‍රීසි - E)

(අදාළ මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

01. 1.1 මුලකුරු සමඟ නම :- ..........................................................................................................................
Mr./Mrs./Miss : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(උදා :- SILVA A.B.C.D.)

1.2 මුලකුරු සමඟ නම :-..........................................................................................................................
මයා/මිය/මෙනවිය (සිංහලෙන්/දෙමළෙන්)

1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :-.........................................................................

..........................................................................................................................

1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්) :...................................................................................

..........................................................................................................................

02. 2.1 ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්:-..........................................................................................

2.2 විද්‍යුත් තැපැල් ලිපිනය :..........................................................................................................................

2.3 ජාතික හැඳුනුම්පත් අංකය :-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

2.4 ස්ත්‍රී/පුරුෂ භාවය : 0 - පුරුෂ , 1 - ස්ත්‍රී

2.5 විවාහක/අවිවාහක බව :- අවිවාහක - 1 විවාහක - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

03. 3.1 උපන් දිනය :-

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| Y | Y | Y | Y | M | M | D | D |

3.2 අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට (2026.02.13) වයස :- අවු. : .............., මාස : ..............., දින :.............

3.3 දුරකථන අංකය : ජංගම :-
(විභාගය සම්බන්ධව දැනුම්දීම සඳහා)
ස්ථාවර :-

04. අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:-....................................................................................

| *ඡන්දහිමි නාම ලේඛනයට අනුව පදිංචිය* | *2022* | *2023* | *2024* |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාසය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාසය | | | |
| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

05. කාලත්‍රයාගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : (අයදුම්කරු මෙම පළාතේ වසර 03 කට වඩා ස්ථිර පදිංචි අයෙකු සමඟ විවාහ වූ විට) :-
..............................................................................................................................................................

| *ඡන්දහිමි නාම ලේඛනයට අනුව පදිංචිය* | *2022* | *2023* | *2024* |
|---|---|---|---|
| මැතිවරණ කොට්ඨාසය | | | |
| ඡන්ද ප්‍රදේශය | | | |
| ඡන්ද කොට්ඨාසය | | | |
| ග්‍රාම නිලධාරී කොට්ඨාසය | | | |
| ගෘහ අංකය | | | |
| නමට ඉදිරියෙන් ඇති පිළිවෙල අංකය | | | |

06. අධ්‍යාපන සුදුසුකම් :-

06.1 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය :-

වර්ෂය: ...................................... විභාග අංකය: ......................................................

| *විෂයය* | *සාමාර්ථය* | |
|---|---|---|
| | *පළමු වර* | *දෙවන වර* |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

07. වෘත්තීය (තාක්ෂණ) සුදුසුකම්:- (වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන ලේඛනවල සහතික කළ පිටපත් ඇමිණිය යුතුය.)

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *පාඨමාලාවේ කාල සීමාව* | *NVQ මට්ටම* | *NVQ සහතිකපත් අංකය* | *සහතික පත් වලංගු දිනය* |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

08. වෙනත් සුදුසුකම්:-..........................................................................................................................................
.......................................................................................................................................................................
.......................................................................................................................................................................
.......................................................................................................................................................................

09. විභාග ගාස්තු රු: 600/- ගෙවීම පිළිබඳ තොරතුරු :

(i) විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නම :-............................................................................................
(ii) දිනය :- .........................................................................................
(iii) කුවිතාන්සි අංකය :- .........................................................................................

**මුදල් ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙම කොටුව තුළ අලවන්න**
**(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)**

10. ඔබ කිසියම් වරදකට උසාවියෙන් දඬුවම් ලබා තිබේද ?.......................................................................
"ඔව්" නම් විස්තර දක්වන්න. :- ........................................................................................................

**අයදුම්කරුගේ ප්‍රකාශය**

11. මෙම අයදුම්පතේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මා දනිමි.තවද ,විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

.................................. ..............................................,
දිනය අයදුම්කරුගේ අත්සන.

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................................................ මහතා/ මහත්මිය/ මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු/ඇය මා ඉදිරිපිට දී ........................... දින ඔහුගේ /ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

.................................. ……...........................................................,
දිනය අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.
(නිලමුද්‍රාව සමඟ)

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :- ……………………………………………….
තනතුර :- ……………………………………………….
ලිපිනය :- ……………………………………………….

13. අයදුම්කරු රජයේ / පළාත් රාජ්‍ය සේවාවේ නියුතු අයෙකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :-

..................................................................................... මහතා/ මහත්මිය/ මෙනෙවියගේ අයදුම්පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ..................................................................... වශයෙන් ස්ථිර / තාවකාලික/ අනියම් පදනමින් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා ඔහු / ඇය තෝරාගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

.................................. .................................................................,
දිනය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව සහිතව)

01-457

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.